**සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව- 2012**

**සමාගම් අරමුදල -154 (6) වාර්තාව**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ සමාගම් අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළගත් ගිණුම්කරණ මුලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළබිඹු කරන බව මා දරන්නා ව මතය වේ.

1.2 **මූල්‍ය ප්‍රකාශන පිළබඳ අදහස දැක්වීම.**

1.2.1 **ගිණුම්කරණ ප්‍රතිපත්ති.**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 වර්ෂයේ විගණන වාර්තාව මගින් පෙන්වා දී තිබියදීත්, එය නොසලකා 2012 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට අදාල ආරම්භක ශේෂ, උපචිත වියදම්, කලින් ගෙව වියදම්, වැරදි නිවැරදි කිරීම් ආදිය ගිණුම්ගත කිරීම සඳහා පොදු ජර්නලයක් භාවිතා කර නොතිබුණි.

(ආ) දේශීය පුහුණු වැඩ සටහන් සඳහා ප්‍රවර්තන වර්ෂයේදී හා ඉකුත් වර්ෂයේදී වැය කර තිබූ එකතුව රු.110,500 ක් පුස්තකාල පොත් යටතේ ප්‍රාග්ධනිත කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. තවද, ගිණුම් ප්‍රතිපත්තිවලට පටහැනිව සියයට 100 ක වාර්ෂික ක්ෂය අනුපාතය යටතේ සම්පූර්ණ මුදලම සමුච්චිත ක්ෂය ලෙස ගිණුම්වල දක්වා තිබුණි.

### 1.2.2 **ගිණුම්කරණ අඩුපාඩු .**

2013 වර්ෂය තුළ කල් පිරීමට නියමිත රු.215,677,391 ක් ව භාණ්ඩාගාර බැඳුම්කරවල වටිනාකම ශේෂ පත්‍රයේ ජංගම වත්කම් යටතේ දැක්විය යුතු වවත්, එය ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණි.

### 1.2.3 **නීති, රීති, රෙගුලාස හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) 2009 නොවැම්බර් 13 දිනැති අංක 438 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | 2012 දෙසැම්බර් 31 දිනට සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය කරගත් ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ විකිණීමට හෝ විනාශ කිරීම සඳහා නිර්දේශ කර ලේඛනයක් පිළියෙල කර තිබුණත්, එම භාණ්ඩ මිලදී ගත් කාලපරිච්ඡේදය හා වටිනාකම් ගණනය කර විකිණීමට, විනාශ කිරීමට හෝ පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදෙශ සංග්‍රහයේ 8.9.1 මාර්ගෝපදේශය | සේවා කොන්ත්‍රාත් සඳහා සමාලෝචිත වර්ෂයේදී ශේෂය රු. 2,981,093 ක් ගෙවීම් කරතිබු කොන්ත්‍රාත් සම්බන්ධයෙන් ගිවිසුම් අත්සන් කර නොතිබුණි. |

## 2. **මූල්‍ය සමාලෝචනය**

**මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් කටයුතු තුළින් ජනිත වූ මූල්‍ය ප්‍රතිඵලය රු.287,126,146 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපි ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.269,443,580 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.17,682,566 කින් වර්ධනය වීම කෙරෙහි සමාලෝචිත වර්ෂයේ වාර්ෂික වාර්තා ලියාපදිංචි කිරීමේ ආදායම් රු.28,993,500 කින් වැඩිවීම විශේෂයෙන් බලපා තිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය.**

3.1. **කාර්ය සාධනය.**

(අ) **සමාගම් සහ අනෙකුත් ලියාපදිංචි කිරීම්.**

සමාගම් සහ අනෙකුත් ලියාපදිංචි කිරීම්වලට අදාල තොරතුරු ඉකුත් වර්ෂය සමග සසඳා පහත දැක්වේ.

| | සංඛ්‍යාව | | 2012වර්ෂයේදී ඉකුත්වර්ෂයට සාපේක්ෂව | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | 2012 | 2011 | වැඩිවීම/ (අඩුවීම) | % |
| ලියාපදිංචි කළ සමාගම් | 7 ,312 | 7,946 | (634) | 8.0 |
| ගොනු පරීක්ෂා කිරීම් | 12,729 | 14,053 | (1,324) | 9.4 |
| නාම අනුමත කිරීම | 14,194 | 15,924 | (1,730) | 10.9 |
| සහතික කළ පිටපත් | 38,459 | 36,980 | 1,479 | 4.0 |
| ආකෘති පත්‍ර ලියාපදිංචි කිරීම | 74,304 | 70,173 | 4,131 | 5.9 |
| වාර්ෂික වාර්තා ලියාපදිංචි කිරීම | 33,845 | 26,397 | 7,448 | 28.2 |
| මූල්‍ය වාර්තා ලියාපදිංචි කිරීම | 2,959 | 2,180 | 779 | 35.7 |
| ආකෘති පත්‍ර විකිණීම | 4,368 | 6,346 | (1,978) | 31.2 |
| ලේකම්වරුන් ලියාපදිංචි කිරීම | 622 | 603 | 19 | 3.1 |

මේ
සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂයේ වාර්ෂික වාර්තා ලියාපදිංචි කිරීම් ප්‍රමාණය ඉකුත් වර්ෂයට වඩා 7,448 කින් හා ආදායම රුපියල් මිලියන 29 කින් හෙවත් සියයට 40 කින් වැඩි වී තිබුණත්, 2012 දෙසැම්බර් 31 දිනට වාර්ෂික වාර්තා ඉදිරිපත් කළයුතු සමාගම් 41,434 කින් වාර්ෂික වාර්තා ඉදිරිපත් කළ සමාගම් සංඛ්‍යාව 13,404 ක් පමණක් වී තිබුණි. මේ අනුව සමාගම් 28,030 ක ප්‍රමාණයක් වාර්ෂික වාර්තා ඉදිරිපත් කර නොතිබූ අතර, එම ප්‍රමාණය සියයට 68 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි. වාර්ෂික වාර්තා ඉදිරිපත් කළයුතු සමාගම්වලින් වාර්ෂික වාර්තා කැඳවීමට අදාල විධිමත් වූ ක්‍රියාකාර වැඩපිළිවෙලක් ද අරමුදල සතුව නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේදී ආකෘති පත්‍ර ලියාපදිංචි ප්‍රමාණය ඉකුත් වර්ෂයට වඩා ඒකක 4,131 කින් හා ආදායම රු. මිලියන 9 කින් එනම් සියයට 31 කින් වැඩි වී තිබුණත්, ලියාපදිංචි කළ සමාගම් ගණන ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී 857 කින් හෙවත් සියයට 10.8 කින් අඩු වී තිබුණි. ඒ අනුව ආදායමද රු. 2,304,000 කින් අඩු වී තිබුණි.

(ආ) **සමාගම් නියාමනය**

සමාගම් පනතෙන් නියම කර ඇති විධිවිධානවලට අනුකූලව ලියාපදිංචි සමාගම්වල කටයුතු මෙහෙයවීම සහ ඒ අනුවක්‍රියාකරන බවට වග බලාගැනීමත්, එසේ ක්‍රියා නොකරන අවස්ථාවලදී නීතිමය වශයෙන් ලියාපදිංචි සමාගම්වල කටයුතු සමාගම් පනතේ නියම කර ඇති විධිවිධානවලට අනුකූලව පවත්වා ගෙන යාම සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ ප්‍රධාන ව්‍යවස්ථාපිත කාර්යයක් වුවත්, ඉහත සඳහන් (අ) හි පරිදි ලියාපදිංචි සමාගම්වල කටයුතු නියාමනය ඉතා දුර්වල තත්ත්වයක පැවතිණි තවද, ඉහත සඳහන් පරිදි සමාගම්වල කටයුතු නියාමනය සඳහා වූ ක්‍රියකාර වැඩපිළිවෙලක් සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව සතුව නොතිබුණෙන් වාර්ෂිකව විශාල ආදායමක්ද අහිමිවෙමින් පැවතුණි.

(ඇ) **1935 අංක 61 දරන සීට්ටු ආඥා පනත.**

සීට්ටු ලියාපදංචි කිරම හා නියාමනය කිරීමේ කාර්යභාරය සමාගම් රෙජිස්ටාර් කාර්යාලයට පවරා ඇතත් සමාලෝචිත වර්ෂය තුළදී මේ යටතේ කිසිදු කාර්යයක් ඉටු කර නොතිබුණි. දිවයින පුරා විසිර සිටින සීට්ටු දමන්නන් විධිමත් පරිදි දැනුවත් කිරීමේ වැඩසටහන් අරමුදල සතුව නොතිබුණි.

(ඈ) **සමිති ආඥා පනත.**

සමිති ආඥා පනත යටතේ සමිති 679 ක් සමාලෝචිත වර්ෂය තුළදී ලියාපදිංචි කර තිබූ අතර, එක් සමිතියකින් ලියාපදිංචි කිරීම සඳහා රු.25 බැගින් රු.16,975 ක ආදායමක් අරමුදලට ලැබී තිබුණි. මෙම ලියාපදිංචි කිරීමේ ගාස්තු මීට වසර 10 ට පෙර සිට නොවෙනස්ව පැවතියද, එය වර්තමානයට සරිලන පරිදි සංශෝධනය කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ගෙන නොතිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා.

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල පිහිටි ඉඩම, ප්‍රවාහන අමාත්‍යාංශයේ එකඟත්වය ඇතිව සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත පවරා ගැනීමට 2007 සැප්තැම්බර් මස 12 දින අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී තිබුණි. කෙසේ නමුත් ඉඩම පවරා ගැනීම 2013 මැයි 31 දින වන විටත් සිදුකර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයට බදු මුදල් ලෙස අරමුදලෙන් රු.මිලියන 13 ක් දුම්රිය දෙපාර්තමේන්තුවට ගෙවීමට සිදුව තිබුණි.

(ආ) 2012 දෙසැම්බර් .31 දිනට ඈවර කිරීම්වලට යටත් සමාගම්වලින් අරමුදලට ලැබී තිබූ රු. 3,977,154 ක් වූ තැන්පත් මුදල්, භාණ්ඩාගාර බැඳුම්කර/බිල්පත්වල ආයෝජනය කිරීමකින් තොරව දින 53 සට දින 365 ත් අතර කාලයක් නිෂ්කාර්යව සමාගම් ඈවර කිරීමේ ජංගම ගිණුමෙහ රඳවා ගෙන තිබුණි.

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා.

---

තොරතුරු තාක්ෂණ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලෝක බැංකු ආධාර මත ලද අරමුදල් පරිගණක පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා 2002 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ රු.9,335,637 ක් වැය කර තිබුණත්, සමාගම් ලියාපදිංචි කිරීම හා සම්බන්ධ කටයුතු පරිගණක ගත කිරම 2013 මැයි 31 දින වන විටත් නිම කර නොතිබුණි.

(ආ) සමාගම් අරමුදලේ ප්‍රතිපාදන යටතේ සමාගම් ලියාපදිංචි කිරීමේ කාර්ය පරිගණක ගත කිරීම සඳහා 2003 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා අරමුදලේ වාර්ෂික අයවැය

ඇස්තමේන්තු මගින් රු. මිලියන 630 කට වැඩි මුදලක්ද වෙන් කර ගෙන තිබුණත්, 2013 මැයි 31 දින දක්වාත් එය ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

එමෙන්ම සමාලෝචිත වර්ෂයේ පරිගණකගත කිරීමේ වැඩසටහන සඳහාද ප්‍රතිව්‍යුහගතකරණය යටතේ තවත් රු.මිලියන 124 ක් වෙන් කර තිබුණද, එහි කටයුතුද 2013 මැයි 31 දින වන විටත් ආරම්භ කර නොතිබුණි.

(ඇ) 1997 පෙබරවාරි 06 දිනැති අංක 351 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය දක්වා විගණකවරයෙකු ලියාපදිංචි කිරීමේ ගාස්තුව ලෙස රු. 135 ක් හා වාර්ෂික අලුත් කිරීමේ ගාස්තුව ලෙස රු. 22 ක් අයකර තිබුණද, වසර 15 ක කාලයක සිට පැවත එන එම ගාස්තු සංශෝධනය කිරීම කෙරෙහි සමාගම් අරමුදල අවධානය යොමු කර නොතිබුණි.

**3.4 මතභේදයට තුඩු දෙන ගණුදෙනු.**

2007 වර්ෂයේ සමාගම් අරමුදලින් රු. 90,275,000 ක මුදල් යොදවා පෞද්ගලික සමාගමකට අයත් කොටස් මිලදී ගෙන තිබුණද, මෙම කොටස්වල අයිතිය සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයට හිමිව තිබුණි. අයිතිය සනාථ නොවන මෙම කොටස්වල වටිනාකම සමාගම් අරමුදලේ වත්කමක් ලෙස ගිණුම්වල දක්වා තිබුණි. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එහි අයිතිය මෙන්ම ප්‍රතිලාභ සමාගම් අරමුදලට ලැබී නොතිබුණි.

**3.5 නිෂ්ක්‍රීය වත්කම්**

ධාවනයෙන් ඉවත් කර තිබූ වසර 20 ට වඩා පැරණි මෝටර රථයක් අපහරණය කිරීම සඳහා ක්‍රියාකර නොතිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය.**

**4.1 සංයුක්ත සැලැසම.**

අරමුදලේ දැක්ම හා මෙහෙවර ඉටුකර ගැනීම සඳහා වර්ෂ 03 කට නොඅඩු කාලයක් සඳහා වූ සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 4.2 ප්‍රසම්පාදන සැලැස්ම.

සමාගම් අරමුදලට අදාලව සමාලෝචිත වර්ෂය සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 ( ආ) මාර්ගෝපදේශය ප්‍රකාර ප්‍රසම්පාදන සැලැස්මක්, සකස් කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලන.

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතාවයන් වරින් වර සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) සමාගම් වාර්ෂික වාර්තා ලියාපදිංචි කිරීම් හා සමාගම් නියාමනය කිරීම
(ඇ) ප්‍රසම්පාදනය
(ඈ) ස්ථාවර වත්කම් පාලනය
(ඉ) තොග පාලනය
(ඊ) ආයෝජන
(උ) ලියාපදිංචි ගාස්තු සංශෝධනය කිරීම